**ශීර්ෂය 157 - ජාතික ඒකාබද්ධතා , රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය**

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ඒකාබද්ධතා ,රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික ඒකාබද්ධතා, රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 18 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 අගෝස්තු 12 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කල එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ජාතික ඒකාබද්ධතා ,රාජ්‍ය භාෂා, සමාජ ප්‍රගති හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ..

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසය

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය

ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38 (1) (ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත් ,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට
(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශ පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 විගණන සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුලදී දිස්ත්‍රික් ලේකම් කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදුන් ප්‍රතිපාදනවලට අදාලව දරන ලද පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් පිළිවෙලින් රු.මිලියන 98.19 ක් හා රු.මිලියන 928.68 ක් තහවුරු කර ගැනීමට අදාල හර නිවේදන විගණනයට ඉදිරිපත් නොවුණි. | ප්‍රතිපාදන මගින් දරන ලද වියදම්වලට අදාල හර නිවේදන කාර්යාලවලින් ලබා ගැනීමට කටයුතු කල යුතුවීම. | ලැබෙන සියලුම හර නිවේදන ගොනු ගත කරන අතර ඇතැම් විට එම කාර්යාල වලින් හර නිවේදන නොලැබී ඇති නමුත් ඔවුන් විසින් එවනු ලබන වියදම් වාර්තා හා මාසික ගිණුම් සාරාංශය සසදා බැලීම සිදු කරනු ලබයි. |

### 1.6.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2020 වර්ෂයේ සිට සමාලෝචන වාර්තාවක් ලිඛිතව සකස් කර එය විගණනය වෙත ඉදිරිපත් කිරිමට අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වමි. |

පද්ධති ඵලදායි ලෙස කර ගෙන යෑමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

### 1.6.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය<br>නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 156 (7) | නිලධාරීන් 50 දෙනෙකු වෙත නිකුත් කර තිබූ රු.1,808,043 ක අත්තිකාරම් මුදලින් සියයට 50 ක සිට සියයට 100ක් දක්වා පරාසයක රු.1,093,070 ක ඉතිරිවීම් මුදලින් ආපසු පියවා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වීම. | ඇස්තමේන්තු කිරීම ක්‍රමවත්ව සිදු කලද ,වියදම් කළමනාකරණය කරමින් කටයුතු සිදු කිරීම නිසා මෙසේ මුදල් ඉතිරි වී ඇති බව දන්වමි. |
| (ආ) 2019 අගෝස්තු 22 දිනැති අංක MF/122/CM/2019/319 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ (ii) (ආ) | අතුරුදහන් වූ පුද්ගලයන් සඳහා නිකුත් කරන ලද මරණ සහතික අවලංගු කර දක්නට නොමැති සහතිකයක් නිකුත් කිරීම සඳහා අංග සම්පූර්ණ මාර්ගෝපදේශ සංග්‍රහයක් සකස් කළ යුතු වුවද, එවැනි මාර්ගෝපදේශ සංග්‍රහයක් පිළියෙල කර නොතිබුණි. | අමාත්‍ය මණ්ඩල සංදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | දක්නට නොමැති සහතිකයක් නිකුත් කිරීම සඳහා අංග සම්පූර්ණ මාර්ගෝපදේශ සංග්‍රහයක් පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ තොරතුරු ඇතුලත් ලේඛණය සකස් කර ඇත. |

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 අග්‍රිම කළමනාකරණය

-----------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ----------- | ------------------------------------------ |
| සැලසුම් කළ පරිදි ඉල්ලුම් කළ යුතු අග්‍රිමය හා ඉල්ලුම් කළ අග්‍රිමය අතර රු. මිලියන 2232.67ක වෙනසක් නිරීක්ෂණය වූ අතර ඉල්ලුම් කළ අග්‍රිමය හා ලැබුණු අග්‍රිමය අතර රු. මිලියන 899.20 ක වෙනසක් නිරීක්ෂණය විය. | සැලසුම් කළ පරිදි අග්‍රිම ඉල්ලුම් කළ යුතු වීම. | භාණ්ඩාගාරය මගින් ඉල්ලුම් කරන සම්පූර්ණ මුදල ලබා නොදෙන අතර ලබා දුන් මුදල වියදම් කළමනාකරණය කර ගනිමින් අත්‍යාවශ්‍ය කාර්යයන්ට පමණක් වියදම් කිරිම සිදු කරනු ලබයි. |

### 2.2 වියදම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ------------------- | ---------- | ------------------------------------ |
| (අ) ප්‍රාග්ධන වැය විෂයයන් 02ක් වෙනුවෙන් වූ රු. මිලියන 2,574ක වාර්ෂික ප්‍රතිපාදනය සඳහා පරිපූරක ඇස්තමේන්තු මගින්ද රු.මිලියන 1,388.52 ක් ප්‍රතිපාදන ලබාගෙන තිබුණි. එසේ වුවත්, ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 5/2019 චක්‍රලේඛය අනුව අවුරා තැබීමෙන් පසුවද ශුද්ධ ප්‍රතිපාදනයෙන් පිළිවෙලින් සියයට 60කට සමාන රු. මිලියන 841.52ක් හා සියයට 77කට සමාන රු. මිලියන 1204.24ක් උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි. | මුදල් රෙගුලාසි 50හි සඳහන් විධිවිධාන ඉටුවන පරිදි වාර්ෂික වැය විෂය ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම. | ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 5/2019 චක්‍රලේඛය අනුව හා පාස්කු ප්‍රහාරය නිසා භාෂා හා සහජීවන වැඩසටහන් නොපැවැත්වීම හේතුවෙන් වැය විෂයයන් සඳහා වූ ප්‍රතිපාදනයන් ඉතිරි වී ඇත. |

| | | |
|---|---|---|
| (ආ) ප්‍රාග්ධන වැය විෂයයන් 7 ක් සඳහා සලසා තිබුණු රු.මිලියන 122 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම උපයෝජනය නොකර ඉතිරි කර තිබුණි. | -එම- | මෙහි 2002 වැය විෂය සඳහා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 5/2019 චක්‍රලේඛය අනුව ඉතිරි කර ඇත. |
| (ඇ) පුනරාවර්තන වැය විෂයයන් 30 ක් සඳහා සලසා තිබුණු එකතුව රු.මිලියන 1,060.64 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.මිලියන 395.36 ක් පමණක් උපයෝජනය කිරීම නිසා රු.මිලියන 665.28 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සලසා තිබු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 15ක සිට සියයට 98ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | -එම- | නියෝජ්‍ය අමාත්‍ය කාර්යාලය අහෝසි වීම, 2019 වර්ෂයේ දී සිදු වූ පාස්කු ප්‍රහාරය නිසා සැලසුම් කරන ලද වැඩසටහන් නොපැවැත්වීම, විදේශ සංචාරයන් සීමාවීම හා ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරක නිලධාරීන් සඳහා වැටුප් පරිවර්තනයන් සිදු නොවීම නිසා වැය විෂයන්වල ප්‍රතිපාදනයන් ඉතිරි වී ඇත. |
| (ඈ) ප්‍රාග්ධන වැය විෂයයන් 12 ක් සඳහා සලසා තිබුණු එකතුව රු. මිලියන 727ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් එකතුව රු.මිලියන 262.99ක් පමණක් උපයෝජනය කිරීම නිසා රු.මිලියන 464 ක් ඉතිරි වී තිබුණි. එම ඉතිරිය සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 40 ක සිට සියයට 99.67 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් වී තිබුණි. | -එම- | පාස්කු ප්‍රහාරය, වියදම් කළමනාකරණය හා ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 5/2019 චක්‍රලේඛය අනුව ප්‍රාග්ධන වැය විෂයයන්හි ප්‍රතිපාදන ඉතිරි කර ඇත. |

## 2.3 බැරකම් හා බැදීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට සිගාස් වැඩසටහන යටතේ දක්වා ඇති බැරකම්වල වටිනාකම රු. මිලියන 810.58 ක් වු අතර, මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වටිනාකම රු. මිලියන 788.54 ක් වූයෙන් වෙනස වූ රු.මිලියන 22.03 ක් විය. මෙය 2018 වර්ෂයේ බැරකමක් වූ බැවින් එම බැරකම සමාලෝචිත වර්ෂයේදි නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව බැදීම් හා බැරකම් සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වීම. | 2018 වර්ෂයෙහි අගයන් ඉවත් කර 2019 වර්ෂයට අදාලව නිකුත් කරන ලද බැදීම් හා බැරකම් පමණක් මූල්‍ය ප්‍රකාශනයෙහි සඳහන් කර ඇත. |
| (ආ) 2019 මූල්‍ය ප්‍රකාශනවල ජාතික භාෂා අධ්‍යාපන හා පුහුණු ආයතනයේ, අතුරුදන්වූවන් පිළිබඳ කාර්යාලයේ සහ රාජ්‍ය භාෂා කොමිසමේ ගෙවිය යුතු බැරකම් වටිනාකම රු.මිලියන 2.15 ක් අඩුවෙන් දක්වා තිබුණි. | -එම- | මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමේදි එම ආයතන විසින් ලිඛිතව ලබා දුන් බැදීම් හා බැරකම් විස්තර පමණක් මූල්‍ය ප්‍රකාශනයෙහි ඇතුළත් කර ඇත. |

## 2.4 රජයේ නිළධාරින්ගේ ණය අත්තිකාරම් පියවීම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වැඩ තහනම් කර ඇති නිලධාරින් 03 දෙනෙකුගෙන් අයවිය යුතු වර්ෂ 5ට වැඩි එකතුව රු.235,320 ක් හා එක් නිලධාරියෙකුගෙන් අයවිය යුතු වර්ෂයකට වැඩි රු. 229,415ක ණය ශේෂය සමාලෝචිත වර්ෂයේදි ද අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂ නිරවුල් කර ගැනීමට පියවර ගත යුතු වීම. | සේවකයින් දෙදෙනෙකුගේ ණය ශේෂ අයකර ගැනීමට දිසා අධිකරණවල නඩු පවරා ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) 2017, 2018 හා 2019 වර්ෂවලදී ජාතික සමඟිය හා සංහිඳියා කාර්යාංශය විසින් මල්මඩුවාව ග්‍රාමයේ නිවැසියන්ට ජලය ලබා දීමේ අරමුණින් පොදු ළිඳ හා ජල නල පද්ධතිය සඳහා පිළිවෙලින් රු. මිලියන 2.88ක් හා රු. මිලියන 5.29ක් වැය කර තිබුණි. ජලය ලබා ගන්නා පොදු ළිඳේ ජල මට්ටම වැඩිකර ගැනීමට ළිඳ ගැඹුරු කිරිම වෙනුවෙන් 2019 වර්ෂයේදිද රු.446,576ක් වැය කර තිබුණද, අපේක්ෂිත පරිදි නල ජලය ලබා දීමේ කාර්යය ඉටු වී නොතිබුණි. | අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට ආයතනය ක්‍රියා කළ යුතු වීම. | රු. මිලියනයකි රු.446,576ක් වැය කර තිබුණද, කාර්යය නිම කළ නොහැකි විය. |
| (ආ) යාපනය දිස්ත්‍රික්කය තුළ වැසි ජල ටැංකි 3000ක් වසර 3ක් තුළ ඉදිකිරිම වෙනුවෙන් ඉන්දීය රජයෙන් රු. මිලියන 300 ක ආධාර ලබා දී තිබුණි. එසේ වුවද, කොන්ත්‍රාත්කරුවන් අතරමඟ වැඩ අත්හැර දැමීම හේතුවෙන් 2019 දෙසැම්බර් 31 වන විට අපේක්ෂිත නිමැවුම් මට්ටමින් සියයට 16කට සමාන ටැංකි 489ක් පමණක් ඉදි කර තිබුණි. තවද, ඒ සඳහා රු. මිලියන 51.95ක් වැය කර තිබුණු අතර අපේක්ෂිත ප්‍රගතිය ළඟා කර ගැනීමට නොහැකි වී තිබුණි. | අපේක්ෂිත ප්‍රගතිය ළඟා කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | නිරීක්ෂණය සමඟ එකඟ වේ. |

**3.2 වෙනත් නිරීක්ෂණ**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සේවක පුහුණු වැය විෂයය යටතේ වෙන්කරන ලද ප්‍රතිපාදනය වු රු. මිලියන 27ක මුදලින් රු. මිලියන 7ක් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව වෙත මෙම වැය විෂයයට අදාළ නොවූ බස වඩමු - හද දිනමු ගුවන්විදුලි වැඩසටහන, ජාතික ඒකාබද්ධතා සම්බන්ධීකාරකවරු බඳවා ගැනීමේ තරඟ විභාගය හා කථන දෙමළ පොත සංවාද සහිත විඩියෝ දර්ශන ලෙස සකස් කිරිම වෙනුවෙන් වැය කර තිබුණි. | අදාල කාර්යයන් වෙනුවෙන් ප්‍රතිපාදන වෙන් කළ යුතු වීම. | 2018 වර්ෂයේ අතිරේක ප්‍රතිපාදන යටතේ ආරම්භ කරන ලද වැඩසටහන් 2019 වර්ෂයේදිද ක්‍රියාත්මක වු බැවින් මෙම ප්‍රතිපාදන වෙන් කර දී ඇත. |

**3.3 අනාර්ථික ගනුදෙනු**

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂයේදි අ.පො.ස. (සා.පෙළ) දෙවන බස සමත් සිසුන් 3185 ක් ඇගයීම සඳහා ත්‍යාග ප්‍රදානය කිරිම වෙනුවෙන් රු. මිලියන 4.7ක් වැය කර තිබුණු අතර ඊට සමගාමීව පැවැත්වූ උත්සවය වෙනුවෙන් රු.මිලියන 17.8ක් වැය කර තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව අරපිරිමැස්මෙන් හා කාර්යක්ෂමතාවයෙන් කටයුතු කළ යුතු වීම. | සියළුම වියදම් මුදල් රෙගුලාසි හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව අරපිරිමැස්මෙන් හා කාර්යක්ෂමව දරා ඇත. |

### 3.4 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (අ) අමාත්‍යාංශය විසින් 2015-2017 කාල පරිච්ඡේදය වෙනුවෙන් රාජ්‍ය භාෂා සංකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා මධ්‍යකාලීන භාෂා සැලසුමක් සකස් කර තිබුණද, එය ක්‍රියාවෙහි යොදවා නොතිබුණි. | රාජ්‍ය භාෂා සංකල්පය ක්‍රියාත්මක කිරීම සඳහා සැලසුම් සකස් කර ක්‍රියාවෙහි යෙදවිය යුතු වීම. | 2020 – 2022 කාලපරිච්ඡේදයට අදාලව භාෂා සැලැස්ම යාවත්කාලීන කර අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන කැනේඩියානු ව්‍යාපෘතියේ සහය ඇතිව ක්‍රියාත්මක කිරීමට නියමිතය. |
| (ආ) මහජනයා විසින් සෘජුවම පරිහරණය කරනු ලබන ආකෘතිපත්‍ර 36 ක් පමණක් සිංහල භාෂාවෙන් හා දෙමළ භාෂාවෙන් පරිවර්තනය කිරීමට රු. මිලියන 1.2 ක් වැය කර තිබුණද, මෙම පරිවර්තිත පෝරම වෙබ් අඩවියෙන් බාගත කල නොහැකි වී තිබුණි. | වෙබ් අඩවියට ඇතුලත් කර තිබෙන තොරතුරු අවශ්‍ය පරිදි බාගත කල හැකි විය යුතු වීම. | මෙහි සඳහන් වන ආකෘතිපත්‍ර 36 ත්‍රෛභාෂාවටම පරිවර්තනය කර පිටු සැකසුම ද සිදු කර අවසන්ව ඇති අතර මේ වන විට වෙබ් අඩවියට ද ඇතුලත් කර ඇත. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2019 දෙසැම්බර් 31 දිනට තනතුරු 211 ක් පුරප්පාඩු වී තිබුණි. | අත්‍යාවශ්‍ය තනතුරු සඳහා බඳවා ගැනීම කඩිනම් කළ යුතු වීම. | මාණ්ඩලික නිලධාරී තනතුරු වල පැවැති පුරප්පාඩු මෙන්ම සෙසු තනතුරු වල පුරප්පාඩු සම්බන්ධව ද රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශ ලේකම් වෙත දන්වා එම තනතුරු වල පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |